දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

| | |
|---|---|
| අමාත්‍යතුමා / அமைச்சர் / Minister | 2784832 / 2784807 / 2785617 |
| ලේකම් / செயலாளர் / Secretary | 2784812 |
| කාර්යාලය / அலுவலகம் / Office | 2785141-50 / Fax: 2784846 |

ඊමේල්/ஈ–மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எமது இல. / Your No. – ED/01/12/15/02/05

ඔබේ අංකය / உமது இல. / Your No. – ...............................

දිනය / திகதி / Date – 2017. 03. 31

චක්‍රලේඛ අංකය-17/2017

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන්,
සියලු ම පරිවේණාධිපති හිමිවරුන් වෙත.

**<u>පාසල් සහ පිරිවෙන් ආශ්‍රිත ව සංවත්සර සමරු මුද්දර නිකුත් කිරීම.</u>**

ශ්‍රී ලංකාවේ පාසල් සහ පිරිවෙන් ආශ්‍රිත ව සංවත්සර සැමරුම් සඳහා උත්සව සංවිධානය කරනු ලබන අවස්ථාවල දී ඒ වෙනුවෙන් සමරු මුද්දර නිකුත් කිරීමට ක්‍රියා කිරීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. දිවයිනේ පාසල් හා පිරිවෙන් විශාල සංඛ්‍යාවක් පවතින අතර මෙම සියලු පාසල් හා පිරිවෙන් සංවත්සර සමරු මුද්දර නිකුත් කිරීමට උත්සාහ කළහොත් ගැටලු රාශියක් උද්ගත විය හැකි ය.

මෙවැනි ඉල්ලීම් සඳහා තව දුරටත් සංවත්සර සමරු මුද්දර නිකුත් කිරීම මඟින්, මුද්දරවල මුද්දරමය වටිනාකම පහත වැටීමේ අවදානම හඳුනාගත් ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර උපදේශක මණ්ඩලය, පාසල් හා පිරිවෙන් සංවත්සර සඳහා සමරු මුද්දර නිකුත් නොකිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත.

එබැවින්, පාසල් සහ පිරිවෙන් ආශ්‍රිත සංවත්සර සැමරුම් වෙනුවෙන් මින් ඉදිරියට සමරු මුද්දර නිකුත් නොකරන බැවින්, විදුහල්පතිවරුන් හා පරිවේණාධිපතිවරුන් විසින් හෝ වෙනත් පුද්ගලයෙකු/ කණ්ඩායමක්/සංවිධානයක් මඟින් සංවත්සර සමරු මුද්දර නිකුත් කිරීම සඳහා ඉල්ලීම් නොකළ යුතු ය.

මෙම උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්-
01. ජනාධිපති ලේකම්, කොළඹ. - කාරුණික දැන ගැනීම සඳහා
02. ලේකම්, තැපැල්, තැපැල් සේවා සහ මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය. - කාරුණික දැන ගැනීම සඳහා
03. තැපැල්පති. - කාරුණික දැන ගැනීම සඳහා
04. අධ්‍යාපන අධ්‍යක්ෂ, පිරිවෙන්. - අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට
05. අධ්‍යාපන අධ්‍යක්ෂ,පෞද්ගලික පාසල් ශාඛාව. - අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට